නියෝජිතයන් රැසක් මෙම වැඩසටහනට සහභාගී වූහ. යාපනය ප්‍රදේශයේ ව්‍යාපාරික නියෝජිතයෝ ද මෙම වැඩසටහනට සහභාගී වූහ. නව වාණිජ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමේ සහ ද්විපාර්ශ්වික වෙළෙඳාම පුළුල් කිරීමේ අරමුණින් ව්‍යාපාර-ව්‍යාපාර අතර ඵලදායි සබඳතා සඳහා වේදිකාවක් මෙමගින් ලබා දෙන ලදී.

4. මෙම අවස්ථාව අමතමින් ඉන්දීය මහ කොමසාරිස්තුමා ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ ආයෝජන තවදුරටත් පුළුල් කිරීමට පවතින සුවිසල් විභවතාවය අවධාරණය කළේය. ව්‍යාපාර-ව්‍යාපාර අතර හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමේ වැදගත්කම පෙන්වා දුන් එතුමා රාජ්‍ය මට්ටමේ ආර්ථික නියැළීම ඉන්දියාවේ ජාත්‍යන්තර ආර්ථික ක්‍රියාකාරකම්වල වැදගත් අංශයක් ලෙස පෙරට පැමිණ තිබෙන බව පැවසීය.

5. ඉන්දියානු වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය සහ තරුණ ලාංකීය ව්‍යවසායකයන්ගේ මණ්ඩලය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් දෙකක් නිල වශයෙන් හුවමාරු කර ගැනීම ද මෙහිදී සිදු විය. මෙම අවබෝධතා ගිවිසුම්වල අරමුණු වන්නේ තොරතුරු බෙදා හදා ගැනීම, වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම, ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගැනීම සහ සහයෝගීතාවයට පවතින නව අවස්ථා හඳුනා ගැනීම හරහා ආයතනික සහයෝගීතාවය ශක්තිමත් කිරීමයි.

6. ඉන්දියානු වාණිජ මණ්ඩල දූත පිරිසේ ශ්‍රී ලංකා සංචාරය තුළින් වඩා සමීප රාජ්‍ය මට්ටමේ සහ කලාපීය හවුල්කාරිත්වයන් දිරිමත් කරමින් ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ ආයෝජන ඉහළ නැංවීම, ව්‍යාපාර-ව්‍යාපාර අතර සබඳතා ශක්තිමත් කිරීම සඳහා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පොදු කැපවීම යළිත් තහවුරු කරන ලදී.

***

**කොළඹ**

***2026 ජූලි 30***